ශ්‍රී ලංකා විවෘත
විශ්වවිද්‍යාලය

# පෙර පාසල් අධ්‍යාපන
# උසස් සහතික පත්‍ර වැඩසටහන

2020/2021



මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
*අධ්‍යාපන පීඨය*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය


# පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර

# වැඩසටහන

# පිළිබඳ තොරතුරු

## 2020 / 2021


මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තැ. පෙ. 21, නාවල, නුගේගොඩ

දුරකථන **011-2881482 / 2881078**

**E-mail** : Postmast@eductn.ou.ac.lk

**Web** : www.ou.ac.lk

**දයාබර සිසු / සිසුවිය,**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මහජන අවශ්‍යතාවලට සරිලන පරිදි රටෙහි සංවර්ධනය උදෙසා පුහුණු ශ්‍රමය සපයන, පුද්ගල සංවර්ධනයට ආධාර වන ආයතනයකි.

මෙම ආයතනය දුරස්ථ අධ්‍යාපන ක්‍රමය තුළින් ඉගැන්වීමේ වැඩසටහන් දියත් කරයි. මූලික අධ්‍යාපන අවස්ථා නොලද, අතරමග දී අධ්‍යාපන කටයුතු වලින් ඉවත් වූ, එමෙන් ම තවදුරටත් අධ්‍යාපන අවස්ථා උදාකර ගැනීමට වෙහෙසෙන අයට විශේෂයෙන් යොමු වන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අධ්‍යාපන වැඩසටහන් සකස් කර ඇත.

ඉගෙනීමට තම සම්පූර්ණ කාලය මිඩංගු කිරීමට අපහසු සිසුනට වයස් සීමාවකින් තොරව අධ්‍යයන කටයුතු කිරීමට මෙම ආයතනය පහසුකම් සලසා ඇත. තම සුදුසුකම් අනුව තමා කැමති වැඩසටහනක් තෝරා ගත හැකිය.

සිසුන් හට තම කැප කිරීම තුළින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අත දීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සැම විටම කැප වී සිටියි.

# අන්තර්ගතය


**1'** හැඳින්වීම

**2'** අධ්‍යාපන පීඨය

- **2.1** මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**3.** පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන හා අදාළ තොරතුරු

- **3.1** උරමුණු
- **3.2** ඇතුළත්වීම සඳහා සුදුසුකම්
- **3.3** වැඩසටහනේ අන්තර්ගත කරුණු
- **3.4** ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය
- **3.5** ඇගයීම් ක්‍රමය
- **3.6** අධ්‍යයන මාධ්‍යය
- **3.7** ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන
- **3.8** සහතික ප්‍රදානය
- **3.9** ගාස්තු
- **3.10** ලියාපදිංචිය සහ ගෙවීම්
- **3.11** වැඩසටහන ආරම්භය

# 1. හැඳින්වීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශ, පීඨ පහක් යටතේ පිහිටුවා ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ.

1 අධ්‍යාපන පීඨය
2 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
3 ස්වභාවික විද්‍යා පීඨය
4 ඉංජිනේරු සහ තාක්ෂණ විද්‍යා පීඨය
5 සෞඛ්‍ය විද්‍යා පීඨය

මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මණ්ඩපය සහ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය නාවල පිහිටා ඇත එමෙන් ම ප්‍රාදේශීය මධ්‍යස්ථාන අධ්‍යයන මධ්‍යස්ථාන ඉගැන්වීමේ මධ්‍යස්ථානල විශාල සංඛ්‍යාවක් දිවයින පුරාසිරිවි ඇත

# 2. අධ්‍යාපන පීඨය

මෙම පීඨය පහත සඳහන් දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ

1' මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
2. ද්විතියික හා තෘතියික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 2.1 මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය යටතේ මෙම අධ්‍යයන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ

### මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මෙහෙය වන අධ්‍යයන වැඩසටහන්

පෙර පාසල් අධ්‍යාපන සහතික පත්‍ර වැඩසටහන
පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන
මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන

# 3. පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන හා අදාළ තොරතුරු

කාල සීමාව - අවුරුදු 01

මාධ්‍යය - සිංහල ඉංග්‍රීසි දෙමළ

අධ්‍යයන වර්ෂය - 2020 / 2021

## 3.1 අරමුණු

(අ) කුඩා දරුවන් රැක බලා ගැනීමෙහි හා කුඩා දරුවන්ට ඉගැන්වීමේ නිරත වී සිටින අයට ළමා සංවර්ධන මූලධර්ම පිළිබඳ දැනුම වඩාත් පුළුල් කිරීම

(ආ) ශ්‍රී ලංකාවේ දරුවන් වෙත වැඩි අවධානයක් යොමු කරමින් පූර්ව ළමා අවධියේ ගැටළු පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙන් ම වර්තමාන සමාජ, සංස්කෘතික පරිසරයට ගැළපෙන පරිදි ළමා සංවර්ධනය හා සම්බන්ධ අගයන් හා සාරධර්ම පිළිබඳව දැනුවත් කිරීම.

(ඇ) ළමා අධ්‍යයන ක්‍රම හා කුඩා දරුවන් ගේ ඉගෙනුමට අදාළ ක්‍රම විද්‍යාව සම්බන්ධ කුසලතා වර්ධනය කිරීම.

(ඈ) කුඩා දරුවන්ගේ පුද්ගල විවිධතා හා සමායෝගී වීමේ ගැටළු වටහා ගෙන ප්‍රතිකාර්ය වැඩ සැලසුම් කිරීමට යොමු කිරීම.

## 3.2 ඇතුළත්වීම සඳහා සුදුසුකම්

(අ) අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 හෝ ඊට වැඩිවීම

(ආ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වා ගෙන යනු ලබන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන සාර්ථකව නිම කර තිබීම

(ඇ) වැඩසටහන හැදෑරීම සඳහා ඔබ විසින් තෝරා ගනු ලබන මාධ්‍යය පිළිබඳව මනා දැනුමක් තිබීම.

## 3.3 වැඩසටහනේ අන්තර්ගත කරුණු

මෙම වැඩසටහන **අනිවාර්ය** හා **වෛකල්පික** පාඨමාලාවන්ගෙන් සමන්විත ය සෑම ශිෂ්‍යයෙකු ම විසින් **අනිවාර්ය පාඨමාලා හතරක්** හා තෝරාගත් **එක් වෛකල්පික පාඨමාලාවක්** හැදෑරිය යුතු වෙයි

(අ) **අනිවාර්ය පාඨමාලා**

| පාඨමාලා කේතය | පාඨමාලා නාම | සම්මාන සංඛ්‍යාව |
|---|---|---|
| EPC 2815 | මුල් ළමාවියෙහි සංවර්ධනය | 8 |
| EPC 2816 | පෙර පාසල් ඉගෙනුම්-ඉගැන්වීම් පිළිබඳ ක්‍රම හා කළමනාකරණය | 8 |
| EPC 2517 | මුල් ළමාවියේ අධ්‍යාපනය පිළිබඳසමාජ-සංස්කෘතික සාධක | 5 |
| EPC 2518 | ව්‍යාපෘතිය | 5 |

(ආ) වෛකල්පික පාඨමාලා

| පාඨමාලා කේතය | පාඨමාලා නාම | සම්මාන සංඛ්‍යාව |
|---|---|---|
| EPC 2419 | මුල් ළමාවියේ කෙළි සෙල්ලම් | 4 |
| EPC 2421 | මුල් ළමාවියේ සමායෝගී වීමේ ගැටළු | 4 |
| EPC 2422 | ළමා අයිතිවාසිකම් | 4 |

## 3.4 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දුරස්ථ ඉගෙනුම් ආයතනයක් බැවින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයකට වඩා වෙනස් වේ මෙම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන්ට ලියාපදිංචි වන අවස්ථාවේ දී ඉගෙනුම් කට්ටලයක් ලබා දෙන ලැබේ එම ඉගෙනුම් කට්ටලය ස්වයං අධ්‍යයනයට ගැළපෙන පරිදි සකස් කර ඇති බැවින් සිසුන් විසින් ම ස්වයං අධ්‍යයනයට යෙදිය යුතු වේ. සති අන්තයේ දිනවල (සෙනසුරාදා හෝ ඉරිදා පැවැත්වෙන දින පාසල්වල දී ඔබට උපදේශක සහායක් ලැබෙන ඇත) මෙම දින පාසල්වල දී සාකච්ඡාකාර්ය සැසි වීඩියෝ දර්ශන හා ප්‍රායෝගික වැඩ සඳහා උපදෙස් සැපයීම සිදු කෙරෙනු ඇත

දුරස්ථ අධ්‍යාපන ක්‍රමයේ මූලික අංගයක් වන මුද්‍රිත ඉගෙනුම් ද්‍රව්‍ය මෙම වැඩසටහන් වල ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය වේ ශිෂ්‍යයාගේ විශ්ලේෂණ කුසලතා වර්ධනය කරගැනීමට මෙම මුද්‍රිත ද්‍රව්‍ය උපකාරී වේ. තවද ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ක්‍රමය තම අධ්‍යයන කටයුතු කර ගෙන යෑමට සිසුන් තුළ ස්වයං පෙළඹවීමක් ඇති කරයි. මෙම මුද්‍රිත පාඩම් සම්පාදනයේ දී ශිෂ්‍යයාට ස්වයං ඇගයීමක් කිරීමට උපකාරීවන ප්‍රශ්නගත ක්‍රියාකාරකම් කිපයක් ඇතුළත් කර ඇත.

### සම්මාන

විශ්වවිද්‍යාලයීය පාරිභාෂික යෙදුම් අනුව සම්මාන යනු අපො ස (සා/පෙළ) හෝ අපො ස (උ/පෙළ) හෝ වෙනත් විභාගවල සම්මාන වැනි දෙයක් යැයි වරදවා වටහා නොගත යුතුය

යම් ශිෂ්‍යයකු තම ඉගෙනීමට ගත කළ යුතු කාලය පදනම් කරගෙන මෙම සම්මාන ක්‍රමය සකස් කර ඇත සම්මාන එකක් ඉගෙනුම් පැය 50 ක් ලෙස සළකනු ලබයි පෙර පාසල් උසස් අධ්‍යාපන සහතිකපත්‍ර වැඩසටහන සම්මාන 30න් යුක්තය. ඒ අනුව මෙම වැඩසටහන සම්පූර්ණ කිරීමේ දී යම් ශිෂ්‍යයෙකු මිඩංගු කළ යුතු කාලය පැය 1500 කි

ඒ නිසා එක් එක් අධ්‍යයන වර්ෂයකදී ශිෂ්‍යයෙකුට ලියාපදිංචි විය හැකි **උපරිම සම්මාන ප්‍රමාණය** (30) තිහකි

## 3.5 ඇගයීම් ක්‍රමය

ඇගයීම ක්‍රම දෙකකින් සිදුවෙයි එනම් **අඛණ්ඩ ඇගයීම** හා **අවසාන ඇගයීම** යනුවෙනි.

(i) අඛණ්ඩ ඇගයීම

නියමිත අනිවාර්ය පැවරුම් කිහිපයක් මඟින් අඛණ්ඩ ඇගයීම සිදුකෙරෙයි. සිසුන් විසින් මෙම පැවරුම් නියමිත දිනවල ඉදිරිපත් කළ පසු උපදේශකවරුන් විසින් එම පැවරුම් ඇගයීමට ලක් කර නියමිත ශ්‍රේණිය හා අවශ්‍ය උපදෙස් ද සඳහන් කර ආපසු සිසුන් වෙත ලබා දෙනු ඇත.

ඕනෑම පාඨමාලාවක අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ ලැබෙනුයේ එම පාඨමාලාව හා අදාළ පැවරුමකට අවම වශයෙන් 40% ක ලකුණු ලබා ගෙන යෝග්‍යතාව ලබා ගතහොත් පමණි

(ii) අවසාන ඇගයීම

ව්‍යාපෘතිය හැර ඉතිරි පාඨමාලා ලිඛිත පරීක්ෂණ මගින් ඇගැයීමට ලක් කරනු ලබයි.

(iii) ව්‍යාපෘතිය

මෙය ද අවසාන පරීක්ෂණයේ අංගයක් වන අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම අධ්‍යයන වැඩසටහන තුළ දී ලබා දෙනු ඇත.

## 3.6 අධ්‍යයන මාධ්‍යය

මෙම වැඩසටහන **සිංහල දෙමළ හා ඉංග්‍රීසි** මාධ්‍යවලින් පැවැත්වෙයි

**සටහන** - ඉංග්‍රීසි මාධ්‍යය සඳහා ලියාපදිංචිවූ සිසුන් අදාළ පැවරුම්වලට සහ අවසාන පරීක්ෂණයට **ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පිළිතුරු සැපයිය යුතුය.** එසේ නොවන්නේ නම් ඔබගේ එම පිළිතුරුපත් ඇගයීම් නොකරන අතර එම අදාළ පැවරුම්වලට සහ අවසාන පරීක්ෂණයට නැවත **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** මුහුණදීමට ඔබට සිදු වනු ඇත.

## 3.7 ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන

මෙම වැඩසටහන කොළඹ සහ මහනුවර යන මධ්‍යස්ථානවල (**සිංහල, ඉංග්‍රීසි සහ දමිළ** මාධ්‍යයෙන්) පැවැත්වෙන **අතර**

**මාතර, අනුරාධපුරය, බණ්ඩාරවෙල, කුරුණෑගල, රත්නපුර හා අම්පාර මධ්‍යස්ථාන වල සිංහල මාධ්‍යයෙන් පමණක් ද යාපනය මඩකලපුව පුත්තලම වවුනියාව සහ හැටන් යන මධ්‍යස්ථානවල**

දමිළ මාධ්‍යයෙන් පමණක්ද, සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි වී ඇත්නම් පමණක් පවත්වනු ලැබේ.

## ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| පිහිටීම | කේතය | ලිපිනය හා දුරකථන අංක |
|---|---|---|
| කොළඹ | WP10 | විවිප්‍රාම නාවල නුගේගොඩ- 011- 2853930 |
| මහනුවර | CP20 | විවිප්‍රාම පොල්ගොල්ලමහනුවර 081-2494495-97 |
| මාතර | SP30 | විවිප්‍රාම, නූපේ මාතර - 041-2222943 |
| යාපනය | NP40 | විවිප්‍රාම, බ්‍රවුන්ස් පාර, කොකුවිල්,යාපනය 021-2223374 |
| අනුරාධපුරය | NC50 | විවිප්‍රාම, ජයන්තිමාවත, අනුරාධපුරය 025-2222871 |
| මඩකලපුව | EP60 | විවිප්‍රාම, නො.23, අලුත්පාර, මඩකලපුව 065-2222264 |
| කුරුණෑගල | NW70 | විවිප්‍රාම, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල - 0372223473 |
| හැටන් | CP21 | විවිඅම, තොන්ඩමන් වෘත්තිය පුහුණු මධ්‍ය හැටන්-051-2225139හෝ051-2223492 |
| බණ්ඩාරවෙල | UP81 | විවිඅම, ගාන්තතෝමස් පාර,වැවේතැන්න, බණ්ඩාරවෙල - 0572222820 |
| රත්නපුර | SG90 | විවිඅම, හිදැල්ලන,රත්නපුර- 0452228660 |
| අම්පාර | EP61 | විවිඅම, ඉගිනියාගල පාර,සාමපුර, අම්පාර 0632222052 |
| පුත්තලම | NW71 | විවිඅම, නො. 1/137, කොළඹ පාර, පුත්තලම 0322266822 |
| වව්නියාව | NP41 | විවිඅම, නො. 366, නුවර පාර, තේක්කවත්ත, වව්නියාව - 0242222995 |

විවිප්‍රාම - විවෘත විශ්ව විද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථාන විවිඅම - විවෘත විශ්ව විද්‍යාල අධ්‍යයන මධ්‍යස්ථාන

## 3.8 සහතික ප්‍රදානය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන විධි විධානවලට අනුකූලව පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතිකය ප්‍රදානය කරනු ලැබේ

## 3.9 ගාස්තු

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු හා ශිෂ්‍යෝපදේශන ගාස්තු පහත සඳහන් පරිදි වේ

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා

| | | | |
|---|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | } | රු | 400.00 |
| පහසුකම් ගාස්තු | } | රු | 1500.00 |
| ශිෂ්‍යෝපදේශන ගාස්තු | } | රු | 36300.00 |
| මුළු ගාස්තුව | } | රු | 38200.00 |

ගාස්තු වාරික දෙකකින් ගෙවීම් කළ හැකිය

## 3.10 ලියාපදිංචිය සහ ගෙවීම්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කොළඹමහනුවර සහ මාතර යන ප්‍රාදේශීය මධ්‍යස්ථානවල මෙන් ම වැඩසටහන පවත්වනු ලබන මධ්‍යස්ථානවල දී ශිෂ්‍යයන් ලියාපදිංචි කරනු ලැබේ

ලියාපදිංචිය සිදු කළ අවසාන දිනයේ සිට **මාසයක් ඇතුළත** දී ලියාපදිංචි වූ පාඨමාලා වෙනස්කර ගැනීම හෝ වෙනත් පාඨමාලා ඇතුළත් කර ගැනීම හෝ ඉගෙනුම ලබන මාධ්‍ය වෙනස් කර ගැනීම සඳහා හෝ අවසරදිය හැකිය

වැඩසටහනට ලියාපදිංචි වීමේ දී සහ ගාස්තු නියම කරන සෑම අවස්ථාවක දී මල ඒවා අප්‍රමාද ව ගෙවීමට කටයුතු කළ යුතුය. ගාස්තු ගෙවිය යුතු ක්‍රමය වවුචරවල දක්වා ඇත.

## 3.11 වැඩසටහන ආරම්භය

2020/2021 පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන 2018 ජනවාරි මාසයේ ආරම්භ කිරීමට නියමිත ය.

## ඇමුණුම 1

## Online අයදුම්පත් සඳහා උපදෙස්

2020/2021 වැඩසටහන් සඳහා අයදුම්පත් භාර දිය හැක්කේ මාර්ගගත (online) ආකාරයට ය. පළමුව ඔබ කළ යුත්තේ Online Login Account එකක් නිර්මාණය කරගැනීමයි. ඔබගේ අයදුම් පත්‍රය මාර්ගගත (Online) ආකාරයට භාර දී ම සම්බන්ධ ව ඉදිරි වැඩකටයුතු කළ හැක්කේ ඉන් අනතුරුවය.

1. අන්තර්ජාලය තුළ www.ou.ac.lk ලෙස type කරන්න.

2. Online Login Account එකක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෙබ් පිටුවේ ඇති ‘online application’ මත click කරන්න.

3. අළුත් Account එකක් නිර්මාණය කර ගනිමින් එක වර ලියාපදිංචිය ලබා ගන්න. මෙය කිරීම සඳහා ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව ‘create new account’ මත click කරන්න.

### සැලකිය යුතු ය

අවශ්‍යයෙන් ම සම්පූර්ණ කළ යුතුයැයි පෙන්වා දී ඇති තැන්වල ඔබගේ හෝ පවුලේ සාමාජිකයෙකුගේහෝ මිත්‍රයෙකුගේ හෝ ලිපිනය සහ ජංගම දුරකථන අංකය සඳහන් කිරීමට සැලකිලිමත් වන්න.

ඔබගේ අයදුම්පත්‍රයෙහි රිසිට් පත පිළිබඳව දැනුම් දීම සඳහා සහ අවශ්‍ය වූ විටෙක අමතර තොරතුරු ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය මින් ඉදිරියට භාවිත කරනු ලබන්නේ එම විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකථන අංකයයි.

4. ඔබගේ online account එක නිර්මාණය කර ගත් පසු ඔබගේ අයදුම්පත්‍ර භාර දීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කළ හැකි ය. මේ සඳහා 'online application' වෙත ගොස් ඔබගේ 'user name' සහ 'password type' කරන්න. අනතුරුව online application form එක පුරවන්න. එය පුරවා අවසානයේ submit කරන්න.

**සැලකිය යුතු.**


ඔබ ගෙවීම් කරන ක්‍රමය තෝරාගෙන ලබා දී ඇති උපදෙස් අනුව ඊට අදාළ තොරතුරු පුරවන්න. අයදුම්පත්‍ර සඳහා අයකරනු ලබන්නේ 250රු. පමණි. මෙය ඔබට ඔබගේ credit හෝ debit card මගින් ගෙවිය හැකිය. credit සහ debit card නොමැති අයදුම්කරුවන්ට අදාළ ගෙවීම් මුදල් වලින් ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථාන මගින් කළ හැකි ය.

online applitcation එක පිරවීම සඳහා සහයක් අවශ්‍ය අයදුම්කරුවන්ට ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථානයක් මගින් අවශ්‍ය සහය ලබා ගත හැකි ය. ඒ සඳහා පහත තොරතුරු ලබා දිය යුතු ය. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය, ජාතික හැඳුනුම්පත් ,අංකයජංගම දුරකථන අංකය,

පෙර පාසල් අධ්‍යාපන සහතිකපත්‍ර වැඩසටහනෙහි ප්‍රතිඵල සටහන.

Appendix - 1

## Sample Online Application form



# Online Application

### Please fill the Application

**Personal Details**

| | |
|---|---|
| Title | Mr. |
| Initial | |
| LastName | |
| Name Denoted by Initials | |
| Address line 1 | |
| Address line 2 | |
| Address line 3 | |
| NIC/Passport No | |
| Date of Birth | |
| E mail | |
| Telephone -Mobile | |
| Telephone -Fixed | |
| Country | Sri Lanka |

**Programe Details**

| | |
|---|---|
| Programe | Please select |
| Prefferd Center | Please select |
| Programme Medium | Please select |
| Selection Test Medium | Please select |

Appl Now Reset